වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 03

මගේ අංකය : ටීටීඅයිපී/01/2007(1)

වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
කොළඹ 01.
2007 සැප්තැම්බර් 21

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
පලාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත,

## <u>අනුග්‍රාහක පදනම මත වාහන ආනයනය කිරීම</u>

අනුග්‍රාහක පදනම මත වාහන ආනයනය කිරීම සඳහා නිකුත් කරන ලද 2007.08.27 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 02 හි සඳහන් විධිවිධානයන්ට යටත්ව අළුත්ම කොටස් ආනයනය කර දේශීයව නිෂ්පාදනය/එකලස් කරන ලද වාහන මිලදී ගැනිම සඳහා පමණක් මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල වේ.

**02.බදු සහන හා කොන්දේසි**

(i) අනුග්‍රාහක බදු සහන පදනම මත නිකුත් කරන බලපත්‍රය උපයෝගී කරගෙන අළුත්ම කොටස් ආනයනය කර, දේශීයව නිෂ්පාදනය/එකලස් කරන ලද වාහනයක් මිලදී ගතහැකිය. මෙම වාහන නිෂ්පාදනය/එකලස් කිරීම සඳහා ආනයනය කල සැකිල්ල සහ උපාංග වෙනුවෙන් ගෙවිය යුතු රේගු තීරු බද්දෙන් 75% ක ඉවත් කිරීම මඟින් මෙම බදු සහනය ප්‍රදානය කෙරේ.

(ii) මෙම චක්‍රලේඛයේ 02 (i) ඡේදයෙහි සඳහන් වාහනවල සිලින්ඩර ධාරිතාව සහ එක් වාහනයක් නිෂ්පාදනය කිරීම සඳහා ආනයනය කෙරෙන සැකිල්ල සහ උපාංග (Body Shell and Componants) සඳහා වියදම් කළහැකි උපරිම ආනයන වියදම් සීමාවන් පිළිබඳ විස්තර වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙතින් අදාල වාහන නිෂ්පාදනය/එකලස් කරනු ලබන ආයතන විසින් ලබා ගත යුතුය.

(iii) බදු සහන පදනම මත නිකුත් කරන බලපත්‍රයක සඳහන් සිලින්ඩර ධරිතාවයට අනුකුල වාහනයක් පමණක් බලපත්‍රලාභීන් වෙත විකිණීමට දේශීය වාහන නිෂ්පාදකයින්/එකලස්කරන්නන් වගබලා ගතයුතුය.

(iv) අනුග්‍රාහක පදනම මත වාහන ආනයනය කිරීම සඳහා වන බලපත්‍රයක් උපයෝගී කරගත හැක්කේ එක් වාහනයක් නිෂ්පාදනය කිරීම සඳහා ආනයනය කෙරෙන සැකිල්ල සහ උපාංග (Body Shell and Componants) වෙනුවෙන් රේගු බදු ප්‍රදානයක් ලබා ගැනීමට පමණි.

(v) මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව ආනයනය කරනු ලබන වාහන සැකිල්ල සහ උපාංග සඳහා ගෙවිය යුතුවන රේගු තීරු බද්දෙන් 25% ක් සමඟ එකතු කල අගය මත බදු, සෙස් බදු, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන ගාස්තු, ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන ගාස්තු, සමාජ වගකීම් ගාස්තු හා වරින්වර පැනවිය හැකි වෙනත් බදු හෝ ගාස්තු නිෂ්පාදකයා/එකලස්කරන්නා විසින් ගෙවිය යුතුවේ.

(vi) මෙම චක්‍රලේඛ විධිවිධාන මත වාහනයක් නිෂ්පාදනය/එකලස් කිරීමේදී දේශීය වශයෙන් එකතු කල අගය 30% ට වඩා වැඩි අගයක් පවත්වාගෙන යැමට නිෂ්පාදකයා/එක්ලස්කරන්නා වගබලා ගතයුතු අතර එසේ නොමැතිවිටක සැකිල්ල සහ උපාංග ආනයනයන් සඳහා අදාල වන සියළුම බදු ගෙවීමට නිෂ්පාදකයා/එක්ලස්කරන්නා බැඳී සිටී.

(vii) දේශීය වාහන නිෂ්පාදකයින්/එකලස්කරන්නන් විසින් විකිණීම සඳහා ඉදිරිපත් කරන වාහන වර්ග, එක් එක් වාහනයක සම්පූර්ණ බදු සහිත වෙළඳපල මිල සහ අනුග්‍රාහක බලපත්‍රය මත විකුණුම් මිල පිළිබඳ විස්තර, පුවත්පත් දැන්වීම් මගින් ප්‍රසිද්ධ කලයුතුය. එම දැන්වීමේ පිටපතක් වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාටද ඉදිරිපත් කළ යුතුය.

(viii) මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව බදු සහන පදනම මත නිකුත් කෙරෙන බලපත්‍ර සඳහා වාහන නිෂ්පාදනය/එකලස්කර අලෙවි කළ හැක්කේ 51% කට වඩා වැඩි කොටස් ප්‍රාග්ධන හිමිකමක් දේශීය ව්‍යවසායකයන්ට අයත්ව පවතින දේශීයව වාහන නිෂ්පාදනය/එකලස් කරන ආයතනවලට පමණකි.

## 03. බලපත්‍රලාභීන් වෙත උපදෙස්

(i) 2007.03.30 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01 හා 2007.08.27 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 02 යටතේ අනුග්‍රාහක පදනම මත වාහන ආනයන කිරීම සඳහා දැනට නිකුත් කර ඇති සහ ඉදිරියේදී නිකුත් කරනු ලබන වාහන ආනයන බලපත් භාවිතා කර දේශීයව නිෂ්පාදනය/එකලස්කරන වාහන මිලදී ගත හැකිය.

(ii) වාහනයක් ආනයනය කිරීම හෝ දේශීය වශයෙන් නිෂ්පාදනය/එකලස්කල වාහනයක් මිලදී ගැනීම යන දෙකෙන් එක් කටයුත්තක් සඳහා පමණක් නිකුත් කරනු ලබන බලපත්‍රය උපයෝගී කරගත හැකිය.

(iii) අළුත්ම කොටස් ආනයනය කර දේශීයව නිෂ්පාදනය/එකලස් කෙරෙන වාහනයක් මිලට ගැනීමට අපේක්ෂා කරන බලපත්‍රලාභීන්, තම බලපත්‍රය අදාළ වාහන නිෂ්පාදකයා/එකලස්කරන්නා වෙත ඉදිරිපත් කළයුතුය. එහිදී, මෙම චක්‍රලේඛයේ අදාළ සියලුම කොන්දේසි නිෂ්පාදකයා/එකලස්කරන්නා විසින් සපුරා ඇති බවට සැලකිලිමත්වීම බලපත්‍රලාභියාගේ වගකීම වනු ඇත.

(iv) බදු සහන පදනම මත නිකුත් කරන වාහන ආනයන බලපත්‍රය ලබාගැනීමට පෙර ඒ වෙනුවෙන් නීතිමය බැඳීමක් ඇති කරගැනීම (දේශීය නිෂ්පාදකයකු/එකලස්කරන්නකු වෙත ඇණවුම් ඉදිරිපත් කිරීම) සිදු නොකළ යුතුය.

## 04. ක්‍රියා පටිපාටිය

(i) මෙම යෝජනා ක්‍රමය යටතේ, දේශීයව වාහන නිෂ්පාදනය/එකලස් කිරීම කරනු ලබන ආයතන වෙත වාහන නිෂ්පාදනය/එකලස් කිරීම සඳහා ආනයනය කෙරෙන සැකිල්ල සහ උපාංග ශ්‍රී ලංකා රේගුවේ නිෂ්පාදන බැඳුම්කර යෝජනා ක්‍රමය යටතේ ගෙන්වීමට අවසර ලබාදෙනු ලැබේ.

(ii) බදු සහන පදනම මත නිකුත් කරන වාහන ආනයන බලපත්‍ර මත, වාහන නිෂ්පාදනය/එකලස් කිරීමට අදහස් කරන නිෂ්පාදකයකු/එකලස්කරන්නකු, එලෙස නිෂ්පාදනය/එකලස්කරන එක් එක් වාහනය සඳහා භාවිතා කරන සැකිල්ල සහ යොදා ගන්නා උපාංග ප්‍රමාණය, ඒවායෙහි මි.ර.ගැ. වටිනාකම, ඇතුළත් ලේඛණයක් සකස්කර රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළයුතුය.

(iii) මෙම චක්‍රලේඛය පදනම්ව, වාහනය වෙනුවෙන් ආනයනය කල සැකිල්ල සහ උපාංග සඳහා මෙම චක්‍රලේඛයේ 2(i) හි සඳහන් රේගු තීරු බදු අත්හැර්ම කරනු ලබන අතර අනිකුත් බදු මෙම චක්‍රලේඛයේ 2(v) හි අනුව නිෂ්පාදකයා විසින් ගෙවිය යුතුය. තීරුබදු අත්හැර්ම ලබා ගැනීම සඳහා වාහනය නිෂ්පාදනය කර බලපත්‍රලාභියාට විකිණීමට සූදානම් බවට සහතිකයක් නිෂ්පාදකයා/එකලස්කරන්නා විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(iv) මෙම චක්‍රලේඛය යටතට ගැනෙන බලපත්‍ර යටතේ දේශීයව නිෂ්පාදනය/එකලස් කරන වාහනයක් වෙනුවෙන් ආනයනය කෙරෙන කොටස් හා උපාංග වෙනුවෙන් අත්හරින ලද බදු හා ගාස්තු අදාල බලපත්‍රලාභීන්ගේ විස්තර ඇතුලත් මාසික වාර්තාවක් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කලයුතුය.

## 05. අනෙකුත් කරුණු

(i) 2007.03.30 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01 හා 2007.04.16 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01 (i) හා එම චක්‍රලේඛය සංශෝධනය කරමින් නිකුත්කල 2007.08.27 දිනැති වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 02 හි සඳහන් සියළුම කොන්දේසි හා නියමයන් දේශීයව නිෂ්පාදනය/එකලස් කරන්නන්ගෙන් මිලදී ගන්නා වාහන සම්බන්ධයෙන් ද අදාල වනු ඇත.

(ii) බදු සහන බලපත්‍රය උපයෝගී කරගනිමින් දේශීයව නිෂ්පාදනය/එකලස් කරන වාහනයක් මිලදී ගත් දිනය බලපත්‍රලාභීන්ගේ වාහන හිමිකම ලැබූ දිනය සේ සලකනු ලැබේ.

(iii) මෙම චක්‍රලේඛය සම්බන්ධව යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍යවේ නම් පහත සඳහන් දුරකථන අංක මගින් ලබාගත හැකිය.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1. | හේමාල් කස්තුරිආරච්චි මහතා | - | අධ්‍යක්ෂ | - | 2484850 |
| 2. | එන්.කේ.ජී.කේ.නැම්මවත්ත මහතා | - | අධ්‍යක්ෂ | - | 2484784 |
| 3. | පී. බී.එස්.සී.නෝනිස් මහතා | - | සහකාර අධ්‍යක්ෂ | - | 2484939 |
| 4. | කේ. මිගහගේ මහතා | - | සහකාර අධ්‍යක්ෂ | - | 2484940 |

පී. බී. ජයසුන්දර
මහ භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්.

පිටපත්: 1. ජනාධිපති ලේකම්
2. අගාමාත්‍ය ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. ආයතන අධ්‍යක්ෂ ජනරාල්
6. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
7. රේගු අධ්‍යක්ෂ ජනරාල්
8. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
9. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
10. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
11. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්